# Living the Lotus

Buddhism in Everyday Life

9
2021
VOL. 192




## Founder's Reflections

# තෘෂ්ණාව අතහැරීමේ ක්‍රමය

සැප්තැම්බර් මාසයේදී ජපානයේ ඔහිගන් උත්සවය සමරයි. ඔහිගන් යනු දුක් කම්කටොළු වලින් මිදී බුදුන්ගේ ලෝකය වෙත පියනැගීමේ ප්‍රාර්ථනය අලුත් කරන කාලයයි.

බුදුන් වහන්සේ විසින් ‘මේ ධර්මය අසන පුද්ගලයන් තුල සත්‍යාවබෝධය ලබා නොගන්නා අය නොමැත’ ලෙසින් දේශනා කලා. මෙම ධර්මය යනු සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයයි. ඕනෑම පුද්ගලයෙක් තුල බුදු බවට පත්වීමට අධිෂ්ඨානය ඇතිකරලමින්, බුද්ධ ලෝකය වෙත මඟ පෙන්වීම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් තුලින් සිදු කරයි.

එසේම බුදුන් වහන්සේ විසින් මන්මුලා වී සිටින අපට, ‘තෘෂ්ණාව දුරුකර නොගන්නේ නම් සත්‍යාවබෝධය ලැබිය නොහැකිය’ සේ අණ කරමින් පීඩාවට පත්නොකර, දනමය පරිත්‍යාග තුලින් ලැබෙන සතුට කියාදී නොදැනුවත්වම තෘෂ්ණාවේ හදවතින් මිදීමට මඟ පෙන්වා දෙයි. තවද, අන්‍යයන්ට වෛර කිරීමට හා කම්මැලිකමට පත්වන අපිට, ජීවිතයේ නියම සතුට කියාදෙමින් ආධ්‍යාත්මික දියුණුව ඇති කරගැනීමට හැකි අයුරින්ද මඟ පෙන්වයි.

එසේ ගත්කල බුදු දහම තුලින්ද අරක නොකල යුතුයි, මේක නොකල යුතුයි ලෙසින් තහනම් කර නොමැත. බුදු දහම සතුටින් හා පහසු ආකාරයට බුද්ධලෝකයට ළඟාවිය හැකි ආකාරයට මඟ පෙන්වන දහමකි.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 178-179

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මුලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍ර ධානීතුමාගේ මුලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.


Living the Lotus
Vol. 192 (September 2021)

Senior Editor: Keiichi Akagawa
Editor: Kensuke Osada
Copy Editors: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International,


Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp



*President’s Message*

# යහපත් සබැඳියාවන් ඇතිකර ගැනීමට නම්

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## යහපත් සබැඳියාවක් යනු

අපි එදිනෙද ජීවිතය ගත කරන්නේ නොයෙකුත් සබැඳියාවන් මධ්‍යයේය. එනම් නොයෙකුත් සබැඳියාවන් අපව ජීවත් කරවනවා යනුවෙන්ද පැවසිය හැකිය. නොයෙකුත් පුද්ගලයන් හෝ නොයෙකුත් සිදුවීම් සමඟ හමුවීම වගේම, පවුලේ අය සමඟ කරන කතාබහ පවා, එම අවස්ථාව විසින් උදකර දෙන සබැඳියාවන් වේ.

එසේ ඇතිවන නොයෙකුත් සබැඳියාවන් නිතරම යහපත් හා සතුටුදයක විය යුතුයි ලෙසින් අපි ප්‍රාර්ථනා කරනවා.

නමුත්, එසේ සිදු නොවීම අපගේ ජීවිතයේ සාමාන්‍ය දෙයකි. විශේෂයෙන් නොයෙකුත් පුද්ගලයන් සමඟ අප්‍රසන්න සිදුවීම් වලට මුහුණදීමට සිදුවූ විට හා අවාසිදයක තත්වයන් ඇතිවූ විට, එම හමුවීම නම් යහපත් සබැඳියාවක් ලෙසින් නොදැනෙයි.

ජපානයේ ශින්තෝ දහමේ කුරොසුමි නිකායේ නිර්මාතෘ වන මුනිතෙද කුරොසුමි නිර්මාතෘ තුමා මෙසේ පවසා ඇත, ‘යහපත් හෝ අයහපත් සෑම දෙයක්ම මේ විශ්වයේ ආශිර්වාදයක් යැයි සිතන්නේ නම්, කිසිම දුකක් ඇතිනොවේ’ එනම් ‘සෑම දෙයකටම කෘතවේදී වනවිට, මොන දෙය කුමන ආකාරයට සිදු වූවත් එයට කෘතවේදීත්වයක් ඇතිවේ’ යනුවෙනි. මේ ලෝකයේ සෑම දෙයක්ම සිදුවන්නේ දෙවියන් හා බුදුන් වහන්සේගේ ආශිර්වාදයෙන් නිසා ඇතිවන සෑම සැබැඳියාවක්ම යහපත් හෝ අයහපත් ලෙසින් වර්ග කල නොහැකිය. එමෙන්ම තම ආත්මාර්තකාමීත්වයේ සිතුවිලි වලින් මිදෙන්නේ නම්, සෑම හමුවීමක්ම යම් අවශ්‍යතාවයක් ඇතිව සිදුවන කෘතවේදී සැබැඳියාවයන් වන බවයි.

එලෙසින් සෑම සබැඳියාවක් තුලින්ම යථාර්තය ඉගෙන ගනිමින්, පිලිගැනීමට හැකිනම්, එය ‘යහපත් සැබැඳියාවන් ඇතිකර ගැනීමේ’ නියම හරය වේයැයි සිතමි. බෞද්ධයන් වන අපි බුදු දහම අන්‍යයන්ට කියාදීමද මෙයට අයත්වේ. එසේම දැනටමත් රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ විශිෂ්ට සාමාජික පිරිසකට මැදිව, විශිෂ්ට සැබැඳියාවක ආශිර්වාදයෙන් අපි සතුටින් සිටින බව පැවසිය හැකිය.

## හදවතේ ස්වරූපය වැදගත් වේ

අපි නිතරම යහපත් සබැඳියාවන් පමණක් බලපොරොත්තු වන්නේ මන්ද?

එය සතුටට කරුණක් ලෙසින් විශාල පිරිසක් සිතන නිසා වන්නට පුළුවන්. ඒ වගේම දහමට අනුව නම් අපි සියළුදෙනාම බුද්ධ ශක්තියෙන් යුතුව මෙලොවට බිහිවී සිටින නිසා යහපත් සබැඳියාවන් ඇති කර ගත යුතුයි යන ප්‍රාර්ථනයද මූලික හේතුවක් වේ. මන්ද, නිතරම අපගේ හදවත සොයන්නේ සෑම දෙයකම සමානාත්මතාව හා එකමුතුකම වන නිසාය.

එබැවින් ඉදහිට ඇතිවන ආත්මාර්තකාමී සිතුවිලි වලට පරාජය නොවී හමුවන සෑම පුද්ගලයන් හා සිදුවීම් සමඟ යහපත් සබැඳියාවන් ඇතිකර ගැනිමේ වැදගත්ම කරුණ වන්නේ, එම සබැඳියාවන් තුලින් කියාදෙන පාඩම ‘ඉගෙන ගැනිමේ’ ස්වරූපය හා ඒ තුලින් අවබෝධ කරගත් කරුණු ගැන ‘පසු විපරම්’ කිරීම වේ. මන්ද, බුදුන් වහන්සේ නොයෙකුත් මිනිසුන් හා සිදුවීම් තුලින් විවිධාකාරයෙන් අපට ධර්මය දේශනා කරමින්, සත්‍ය පෙන්වාදෙන නිසා, ලබාදෙන එම උපදේශයන් හොඳින් ග්‍රහණය කර ගැනීමෙන් සෑමදෙයක්ම යහපත් සබැඳියාවක් බවට පත්කර ගැනීමට හැකිවේ.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ‘ශුභව්‍යුහ රජුගේ පෙර භවය’ යන 27 වන පරිච්ඡේදයේදී, දරුවන් විසින් තම දෙමාපියන්ව ධර්ම මාර්ගයට ගන්නා ආකාරය ගැන සඳහන් වේ. එහිදී ශුභව්‍යුහ පිය රජතුමා තම තත්වය හෝ ගෞරවය ගැන නොසලකා නම්‍යශීලිව දරුවන්ගේ උපදේශයන්ට සවන් දෙමින් ‘නිහතමානී’ හැඟීමෙන් බුද්ධ මාර්ගය කැපවෙන ස්වරූපය ගැන නිරූපනය කරඇත.

නිර්මාතෘ තුමා නම් පැවසුවේ යහපත් සබැඳියාවක් ගොඩනඟා ගැනීමට නම්, මුලින්ම අන්‍යයන්ට ගරුකරන ලෙසයි. ඒ තුලින් තමාගේ උඩඟුකම පෙන්වන ආත්මාර්තකාමීත්වය ඉවතදැමීමට හැකිවිමෙන් යහපත් සැබැඳියාවන් ඇතිකර ගැනීමට හැකිවන බව පවසයි. එසේ කිරිමෙන් තම දරුවන් පවා, අපට ජීවිතය කියාදෙන ගුරුවරු බවට පත්විය හැකි යහපත් සබැඳියන් ඇතිකර ගැනීමට හැකිවේ. අපගේ ආත්මාර්තකාමීත්වය ඉබේම මතුවන පවුල තුල වුවද, මුරණ්ඩු දෙමාපියන් නොවී, නම්‍යශීලිව දරුවන්ගේ අවවාද පිලිගෙන, යහපත් සබැඳියාවන් ඇතිකර ගැනීමට නම් නැවත නැවත හදවතේ ස්වරූපය ගැන පසුවිපරම් කිරීම වැදගත් වේ.

මේ මාසයේ 10 වෙනිදින අනුස්මරණය කරන සමනිර්මාතෘ මියොකෝ නගනුමා මහත්මිය, ‘අන්‍යයන්ගේ හැඟීම් අවබෝධ කරගන්නේ නම් සෑම කෙනෙකු සමඟම එකඟතාවකින් යුතුව සිටිමට හැකිවේ’ යනුවෙන් පවසමින්, නිතරම අන්‍යයන් ගැන සිතීම අමතක නොකලාය. එසේම ‘අන්‍යයන්ව දුකින් මුදවා ගැනීමට නම්, එය හදවතින් සිදු කලයුතුබව’ තම මෛත්‍රිය හා කරුණාව පෙරදැයි ස්වරූපයෙන් එය පෙන්වාදුන්හ. නොයෙකුත් දරුණු අසනීප හා දැඩි දරිද්‍රතාවය තුලින් ලත් වේදනාත්මක අත්දැකීම් තුලින් ‘අන්‍යයන්ව දුකින් මුදවා ගැනීමට නම්, එය හදවතින් සිදු කලයුතුය’ බව එතුමිය ඉගෙන ගන්නට ඇතැයි සිතමි.

එසේනම්, අප අවට දුකෙන් වේදනාබරිතව සිටින පුද්ගලයන්ව දුකින් මුදවා ගැනීමට අප කළ යුත්තේ කුමක්ද? ...... නොදින් කල්පනා කරන්න, මන්ද යහපත් සැබැඳියාවන් ඇතිකර ගත යුතු එවැනි අවස්ථාවන් අපට මගහැරී තිබෙන්නට පුළුවන්.

From *Kosei*, September 2021.

# දුක් කම්කටුළු ඇති නිසා ජීවිතය සාර්ථකවේ

සප්නා රානි බරුවා
බංගලාදේශ ධර්ම ශාඛාව

මෙම සෙප්පෝව 2021 වසරේ පෙබරවාරි මස 2 වන දින බංගලාදේශ ධර්ම ශාඛාවේදී බුදුන් වහන්සේගේ පිරිණිවන්පෑම නිමිත්තෙන් පැවැත්වූ උත්සවයේදී ඉදිරිපත් කරන ලද්දකි.

මෙවන් සුවිශේෂී දවසක සෙප්පෝව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන හදවතින්ම ස්තුතිවන්ත වනවා. මෙම උත්සවයට සහභාගි වූ සියළු දෙනාටමත් හදවතින්ම ස්තුති වන්ත වනවා.

මම සප්නා රානි බරුවා. පියා අනිල් චන්ද්‍රා බරුවා, මව මාරි ප්‍රව බරුවා සහ බාල සහෝදරයන් සිව් දෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමහල් දියණිය ලෙස මම උපත ලැබුවා. මම දැන් මගේ සැමියා සුකේෂ් තල්කුඩර් සමග ජීවත් වනවා.

1980 වසරේ මට වයස 17 දී, ද්විතීක පාසල් සහතිකය (SSC) ලබාගත් මම, පවුල් සුභසාදනයට (FWV) නවකයන් බඳවා ගැනීමෙන් සමත් වී, වසර එකහමාරක පුහුණු කාලසීමාවකින් පසුව හෙද බලපත්‍රය ලබාගත්තා. ඉන් පසු රජයේ මහජන සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ පවුල් සැලසුම් අංශයේ රැකියාවේ නිරත වී 'මින් ඉදිරියට එළඹෙන්නේ හොඳ කාලයක්' යැයි සිතුවත් මාගේ පියාගේ ව්‍යාපරය බිඳ වැටීම නිසා මම දෙමව්පියන් සහ සහෝදරයන් සමග උපන් ගම වන චිටාගොන් ප්‍රාන්තයේ මිර්ෂාරයි ප්‍රදේශයේ දම්දමා ගමට යාබද කගුරාචූරි ප්‍රාන්තයේ රමුගෝර් ප්‍රදේශයට පදිංචියට යමට සිදු වුනා. වාසනාවකට මෙන් මට එම ප්‍රදේශයේ රජයේ මහජන සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ පවුල් සැලසුම් අංශයේ රැකියාව හිමි විය. පියාත් නව ව්‍යාපාරයක් පටන් ගෙන, මවත් අප ඉගෙනගත් ප්‍රාථමික පාසලේ ගුරුවරියක් ලෙස සේවයේ නිරත වුනා. මේ ආකාරයට කාලය ගත වී යන විට ටික කලකින් පියා රෝගාතුර වුනා.

මම පවුලේ අය වෙනුවෙන් මහන්සි වී රැකියාවේ නිරත වුනා. රැකියාවේ නිරත වී සිටියදීත්, පවුලේ අය ගැන සිතමින් තවමත් අවුරුදු 20 වන මම අනිවාර්‍යයෙන්ම පවුලේ බර කරට ගෙන කටයුතු කල යුත්තේ ඇයි? යන්න අවංකවම මට තේරුනේ නැහැ. නමුත් මම විවාහ වුනොත් බාල සහෝදරන්ගේ ඉගෙනීම් කටයුතු අඩාල වේ යැයි සිතුන නිසා මට විවාහයක් ගැන සිතීමවත් අපහසු දෙයක් වුනා. තනිවම පවුලේ බර කරට අරගෙන වැඩකරන විට දැනෙන පීඩනය නිසා මම පවුලේ අයට දැඩිව කටයුතු කරන්නට පෙළඹුනා. මේ ආකාරයට වසර 20 ක් ගෙවී ගිය පසු අපිට නැවතත් උපන්ගම වන දම්දමා ගමට පදිංචියට යාමට හැකි වුනා.

මාගේ බාල සහෝදරයන් විවාහ වීමෙන් පසුව මම අලුත් ජීවිතයක් ආරම්භ කලා. 2003 වසරේදී මම මගේ සැමියා වන සුකේෂ් තල්කුඩර් සමග විවාහ වුනා. එම වසරේදීම අපි දෙදෙනා පෘතික් බරුවා සාන්ගේ මාර්ගයෙන් රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයට ඇතුල් වුනා.

රිෂ්ෂෝ කෝසෙයිකායි ඉගැන්වීම් සාම්ප්‍රදායික ථේරවාදී දහමට ටිකක් වෙනස්ව, මට එය දැනුනේ අළුත්ම ඉගැන්වීමක් ලෙසයි. සෑම දෙයකටම ස්තුතිවන්ත වෙමින්, ''අන් අය ප්‍රථමයෙන්'' ලෙස අන් අයව සෑම විටම පළමු කොට සිතමින්, සිනාමුසු මුහුණින් කටයුතු කරන රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානයේ ඉගැන්වීම් වලට මාගේ හදවත ආකර්ෂණය වුනා. ධර්ම ශාඛාවේදී සූත්‍ර සජ්ඣායනයෙන් පසුව පැවැත්වෙන හෝසා වටයේදී, සැමගෙම සතුට ප්‍රාර්ථනා කරමින්, අපිට ඇති ප්‍රශ්ණ ගැටළු සාකච්චා කරනවා. ඒ වාගේම අන් අයගේ හොඳ ගතිගුණ අවබෝධ කරගනිමින් සියළු සත්වයන් වෙනුවෙන් යහපත් ක්‍රියාවේ යෙදීම ඉගෙනගන්නවා. මෙවන් කෝසෙයිකායි ඉගැන්වීම් තුලින් මාගේ ජීවිතය යහපත් ආකාරයට වෙනස්කර ගැනීමට හැකි වුනා.

2005 වසරේ ඉන්දියාවේ දිල්ලි නගරයේදී මට බුදු පිළිම වහන්සේ ලබා ගැනීමට හැකියාව ලැබුනා. එය මට ලැබුණු ස්තුතිවන්ත සිද්ධියකි.



හෝසා වටයකට සහභාගිව සිටින සප්නා සාන්.
(තැඹිලි පාට සාරියක් ඇද සිටින කාන්තාව)

2007 වසරේ ජපානයේ ටෝකියෝ මූලස්ථානයේදී පැවැත්වූ ඔයිෂිකි පෙරහැරට සහ ප්‍රධාන බුද්ධ මන්දිරය වැදපුද ගැනීමෙ චාරිකාවට මමත් සහභාගි වුනා. එහිදී ධර්ම මන්දිරය වැදපුද ගැනීමට පැමින සිටින සාමාජිකයන්ගේ යහපත් හැසිරීම් රටාව දැක මගේ සිත පැහැදී, ජපන් සාමාජිකයන්ගේ සෙප්පෝ ඇසීම තුලින් කෝසෙයිකායි ඉගැන්වීම් වල වටිනාකම මට අවබෝධ කර ගැනීමට හැකි වුනා. දම්දමා ගමට පවුල් හෝසා කණ්ඩායමක් නිර්මාණය කරන්න යැයි හිටපු සයිතෝ කියොකයිචෝ සාන් මට වගකීමක් පැවරුවා. මෙවර මූලස්ථනය වැදපුද ගැනීමෙන් ලැබූ අත්දැකීම් සමග මම රිෂ්ෂෝ කෝසෙයිකායි ඉගැන්වීම් මගේ උපන් ගමේ අයට කියාදීමට අධිෂ්ඨාන කර ගත්තා.

එම වසරේම ඔක්තෝම්බර් මස 20 වන දින, දම්දමා වල පවුල් හෝසා කණ්ඩායමක් පටන්ගෙන එහි නායකත්වය හිමි වූ මම, බෙර වාදන මැද දෝතින් බුදුපිළිම වහන්සේ රැගෙන හෝසා කණ්ඩායම ආරම්භකලා. එවිට මාගේ හදවත බුදුන් වහන්සේගේ ධර්මයෙන් පිරීගොස් තිබූ ආකාරය අදටත් මගේ මතකයේ රැඳී තිබෙනවා.

තෙදොරි, මිච්බිකි ආදිය සිදුකරමින් බුදු දහමට අනුකූලව ජීවිතය ගත කිරීම, නික්යෝ නිවානෝ තුමා කියාදුන් ආකාරයට බුදුන් වහන්සේගේ මහා කරුණා ගුණය වටහා ගත හැකි පහසුම මාර්ගය සේම එය අපගේ සතුට රැඳී තිබෙන එකම මාර්ගය බවත් මම හොඳින් අවබෝධ කර ගත්තා. ඒ සදහා දෙස් විදෙස් වල පැවැත්වෙන කෝසෙයිකායි සම්මන්ත්‍රණ වලට සහභාගි වෙමින්, ඇත්තටම සතුටින් ජීවත් වීමට නම්, සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය ඉගෙනගෙන ප්‍රායෝගික ධර්ම පුහුණුව සතුට ලබා ගැනීමේ කෙටිම මාර්ගය බව මම අවබෝධ කරගත්තා.

පවුලේ අය ගැන සිතන හැඟීමත් මාගේ අනාගතයත් වැදගත් කොට සිතන්න ඕනා යන සිතේ දෙගිඩියාවෙන් සිටි මට,ධර්මයේ පිහිටෙන් මා ගැන පසුවිපරම් කර බලමින් මගේ හදවතේ සැනසීම උදකර ගැනීමට මට හැකි වුනා.

විවාහ වී කල් ගත වුනත් අපට දරුවන් ලැබීම ප්‍රමාද නිසා කිහිප සැරයක්ම අසල්වාසීන් ඒ ගැන විමසන විට මම මහත් දුකටපත් වුනා. නමුත් ධර්ම ශාඛාවේදී පැවැත්වූ ධර්ම නායක සම්මන්ත්‍රණයට සහභාගී විමෙන් පසු, අසල්වාසින් අපි ගැන සිතන නිසා එලෙස අපගෙන් විමසුවා යැයි මට ඔවුන්ව තේරුම් ගැනීමට හැකි වුනා. ඉන් පසු මම ඔවුන්ට හදවතින්ම ස්තූතිවන්ත වීමට පටන්ගත්තා.

අපි දරුවන් නොමැති කම නිසා සිටි දුකින් අපිව මුදවා ගත් සයිතෝ කියොකයිචෝ සාන් සහ අරිතොමි කියොකයිචෝ සාන්ට මම හදවතින්ම ස්තූතිවන්ත වනවා. පවුල් හෝසා නායක ලෙස පත්වූ දින, සයිතෝ කියොකයිචෝ සාන් අපිට ''මින් ඉදිරියට ගනන්කල නොහැකි ලෙස ධර්මයේ දරුවන් බිහි කරන්න'' යැයි පැවසුවා. එම උපදෙස අපි දෙදෙනාට ජීවිත කාලයටම වටිනා උපදෙසකි.ඔවුන් දෙදෙනාගේ අනුදැනුම ඇතිව, මට විශාල පිරිසක් ධර්ම මාර්ගයට ගැනීමට හැකියාව ලැබුනා. මම සෑම දිනකම ඔවුන්ගේ සතුට ප්‍රාර්ථනා කරමින් කටයුතු කරනවා.

මුලදී ගමේ අය කෝසෙයිකායි ඉගැන්වීම් පිළිනොගත් නිසා, මට විශාල දුකක් ඇති වුනා. නමුත් ධර්ම නායක පාඨමාලා තුලින් නායකයෙකුගේ කාර්යභාරය සහ වගකීම වටහාගත් මම, නායකයෙකු ලෙස මට පැවරී ඇති රාජකාරිය වටහා ගත්තා. එනම් කියොකයොචෝ සාන්ලා කියාදුන් ආකාරයටම ගමේ සියළු දෙනා මාගේ දරුවන් යන හැඟීමෙන් ඔවුන්ට මිත්‍රශීලි නායකයෙකු බවට පත්වීමයි.

දැන් මම නගෂිමා කියොකයිචෝ සාන්ගේ විශිෂ්ඨ ඉගැන්වීම් තුලින්, මාගේ හදවත වර්ධනයට ධර්මය පුරුදු පුහුණු කරමින් කටුතු කරමින් සිටිනවා. ''ඔබලාට ඇති ප්‍රශ්ණ වලට පිළිතුරු නික්යෝ නිවානෝතුමා සහ නිච්කෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් තුල තිබෙනවා සේම එය වටහාගත් පසු එයින් මිදීමට අපට ශක්තිය ලැබෙනවා'' යැයි නගෂිමා කියොකයිචෝ සාන් කියාදීතිබෙනවා.

මින් ඉදිරියට මාගේ සැමියා සහ සාමාජිකයන් සියළු දෙනා සමග ධර්ම මාර්ගයේ ගමන් කරමින්, ධර්මය පුරුදු පුහුණු කිරීමෙන් අපට ලැබෙන සතුට අන් අයට කියා දෙමින් කටයුතු කරන බවට දිවුරා පොරොන්දු වෙමින්, සෑම දෙනෙකුගේම සතුට ප්‍රාර්ථනා කරමින් මාගේ සෙප්පෝව අවසන් කරනවා.

බොහොම ස්තූතියි.



අරිතොමි කියොකයිචෝ සාන්ගෙන් සහතිකයක් ලබා ගන්නා සජ්නා සාන්

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## නික්යෝ නිවානෝ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය.

### පියාගේ ඉගැන්වීම්







තාත්තා (ජුකිචි) නිහතමානී සහ අවංක පෞරුෂයකින් හෙබි පුද්ගකයෙකු වූ අතර, ගොවිතැන් කටයුතු කැපවීමෙන් කලේය. තවද, සීයා මෙන්ම අසනීප වූවන්ට ප්‍රතිකාර කිරීම, කරදරයක සිටින පුද්ගලයකු දුටුවිට අත්නොහැර උදවු කරන පුද්ගලයකු විය.

එලෙස සිටි තාත්තා, තෝකියෝවේ රැකියාවට යන නිර්මාතෘ තුමාට මෙලෙස අවවාදයක් ලබාදෙනවා. එම අවවාදයනම් ‘‘අඩු වැටුපක් සහිත, වැඩි පැයගනනක් වැඩකිරීමට තිබෙන සහ මහන්සිවී වැඩ කිරීමට තිබෙන රැකියාවක් සොයාගන්න’’ ලෙසය.

එයින් පසුව නිර්මතෘ තුමා, පියාගේ අවවාදය ඔහුගේ ජීවන රටාවේ අඩිතාලම බව සිහියට ගත්තා.

ඔබේ දැනුමට

නිර්මාතෘ තුමාගේ පියාද වයස අවුරුදු 23දී ගෙදරින් පිටත්ව රැකියාවක් කිරීම සඳහා තෝකියෝවට පැමිණෙන අතර, එහිදී නිතරම සෙල්ලම් කරමින් අපිළිවෙලට ජීවත්වන අසල්වාසීන්ව නෙත ගැටුණි. එමනිසා, කම්මැලි ජීවිතයක් ගතකිරීමට හුරු නොවන ලෙස නිර්මාතෘ තුමාට දැඩිලෙස අවවාද ලබා දුන්නේය.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# මවගේ ඉගැන්වීම්







'අම්ම කවදාද නිදාගන්නේ' යනුවෙන් නිර්මාතෘ තුමා හිතන තරමටම ඔහුගේ මව (මියි) හුගක් මහන්සියෙන් නිදිමරන් වැඩ කල පුද්ගලයකු වූවා.

ගොවිතැන් කටයුතු, කෑම හදන වැඩ, පිරිසිදු කරන වැඩ, රෙදි සෝදන වැඩ වගේම රෙදි මසන වැඩ නූල් සඳහා පටපනුවන් ඇති කිරීම නිසා විවේකයක්වත් නොමැති වුනා. නමුත් මව නිතරම සිනාමුසු මුහුණින් සහ කරුණාවන්තව දරුවන්ට සලකනු ලැබුවා.

නිර්මාතෘ තුමාගේ ''නොනිමෙන ගමනක ඇරඹුම'' යන පොතෙහි මවගේ චරිතය 'අවලෝකිතේශ්වර බෝධිසත්වයන් වහන්සේ' ලෙස ලියා තිබෙනවා.

ඔබේ දැනුමට

නිර්මාතෘ තුමා නැවත සුගනුමා වලට පැමිණ සිටින කාලයේ ඔහුගේ මව වයස අවුරුදු 43 වැනි අඩු වයසින් මිය ගියාය. නිර්මාතෘ තුමා ඔහුගේ පොතෙහි 'විනෝදයක් නොමැතිව නිරතුරුවම වෙහෙස මහන්සි වී මියගිය මාගේ මව ගැන සිහි වන විට, අදටත් වැටෙන කඳුළු නවතාගත නොහැකිය' ලෙස ලියා ඇත.



# Director's Column

## සතුටේ පණිවුඩය සොයාගනිමු

අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෙයිචි අකගාවා මහතා

අපි, මේ ලෝකයට මනුෂ්‍යයන් ලෙස ජීවිතය ලබාගෙන, එමෙන්ම නිවැරදි ධර්මය කියාදුන් නික්යෝ නිවානෝ නිර්මාතෘ තුමා හා නිචිකෝ නිවානෝ ප්‍රධානී තුමාගේ පහස ලබමින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හා සැබැඳී සිටින ප්‍රීතිමත් පිරිසක් වේ.

මේ මාසයේ ධර්ම පණිවුඩය තුලින් නිචිකෝ නිවානෝ තුමා 'යහපත් සබැඳියාවන් ඇතිකර ගැනීමට නම්' යන මාතෘකාව යටතේ, හමුවන සෑම සබැඳියාවක්ම හොඳින් භාවිතා කරමින් සතුටට පත්විය යුතුය යන නිර්මාතෘ තුමාගේ ප්‍රාර්ථනය ගැන සඳහන් කරයි.

අපි සැවොම බුද්ධ ශක්තියෙන් යුතුව මෙලොවට බිහිවූ නිසා, 'යහපත් සබැඳියාවන් ඇතිකර ගත යුතුය' යන ප්‍රාර්ථනයෙන්, 'සෑම දෙයකම සමානාත්මතාව හා එකමුතුකම' බලාපොරොත්තු වන නමුත්, හමුවන සෑම සබැඳියාවක්ම ඒ ආකාරයෙන් හොඳින් භාවිතා කරනවාද යනුවෙන් විමසයි.

සෑම දෙයක්ම සමඟම යහපත් සබැඳියාවක් ඇතිකර ගැනීමේ වැදගත්ම කරුණ ලෙස, 'සෑම පුද්ගලයෙක් හා සෑම සිදුවීමක් තුලින් කියාදෙන පාඩම හොඳින් ග්‍රහණය කරගත යුතුය' සේ කියාදෙයි. එසේම, 'අන්‍යයන්ට ගෞරව කිරීම්' තුලින් 'තමාගේ උඩඟුකම පෙන්වන ආත්මාර්තකාමිත්වය බැහැර කර ගැනීමට හැකිය' යන නිර්මාතෘ තුමා කියාදුන් උපදේශයේ වැදගත්කමද එහිදී නැවතවරක් තහවුරු කලා.

සැප්තැම්බර් මාසයේ අනුස්මරණ උත්සවය පවත්වන නියොකෝ නගනුමා තුමිය ගැන සිහිකරමින්, එතුමියගේ මෛත්‍රියේ හා කරුණාවේ ජීවන ගමනින් ඉගෙන ගනිමින්, එදිනෙදා ක්ෂණිකයෙන් හමුවන සෑම හමුවීමක් තුලින්ම බුදුන් වහන්සේ අපට කියාදෙන පාඩම මගහැර ගන්නේ නොමැතිව හොඳින් ග්‍රහණය කරගනිමු.



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: info@rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809, Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**